(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 21.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2015 නොවැම්බර් මස 26 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

167/'15

1.

ගරු ලකී ජයවර්ධන මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1977 දී එවකට නිවාස අමාත්‍යවරයා වූ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ සංකල්පයක් අනුව මධ්‍යම පාන්තිකයන් වෙනුවෙන් මහනුවර හන්තාන ප්‍රදේශයේ නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස සංවර්ධන අධිකාරියට අයත් එම යෝජනා ක්‍රමයේ මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(ii) එහි ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට සියලුම නිවාස පදිංචිකරුවන්ට ලබාදී තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ වනවිට එම භූමිය තුළ අධිකාරියට අයත් හිස් ඉඩම් තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය රජයේ නිවාස අමාත්‍යවරයා විසින් මෙම භූමියේ සුපිරි නිවාස ඉදිකිරීම සඳහා, ඉඩම් විකුණා තිබේද;

(iv) එසේ නම්, ඒ කා හටද; සහ එසේ විකුණූ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම ඉඩම් විකිණීමෙන් අධිකාරිය ලැබූ ආදායම කොපමණද;

(vi) මේ වනවිට එම ඉඩම්වල සුපිරි නිවාස ඉදිකර තිබේද;

(vii) එසේ නම්, ඒවායේ විකුණුම් මිල කොපමණද;

(viii) අධිකාරිය ලැබූ ප්‍රතිලාභයන් කවරේද;

(ix) නිවාස ඉදිකර නොමැතිනම්, එම ඉඩම් යළි අධිකාරියට පවරා ගන්නේද;

(x) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

172/'15

2.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011.03.29 දිනැති මහජන පෙත්සම් පිළිබඳ කාරක සභා තීරණයට අනුව, රැකියා විරහිත පුහුණු ගුරුවරුන් රජයේ පාසල්වලට පත්කිරීම සඳහා දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විධිමත් සම්මුඛ පරීක්ෂණ පවත්වා, නාම ලේඛන 06ක්, 2011.05.03 දින රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවත්;

(ii) එම ලේඛන 06න්, ලේඛන 04ක නම් සඳහන් පුද්ගලයින්ට පමණක්, පත්වීම් ලබා දීමට රේඛීය අමාත්‍යාංශය අනුමතිය ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉතිරි නාම ලේඛන 02හි නම් සඳහන් පුද්ගලයින්, රජයේ පාසල් ගුරුවරුන් වශයෙන් බඳවා ගන්නා දිනය එතුමා මෙම සභාවට දන්වා සිටින්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

180/'15

3.

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස අහිමි වී සිටින පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගෙන, ඔවුන්ට ස්ථිර නිවාස ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— 2015.11.06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.00 සිට අ.භා. 7.00 දක්වා ද විය යුතු ය. අ.භා. 7.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ඖෂධ විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2016) — (සිව්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 නොවැම්බර් 20) [1]

*2.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

මුදල් අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග,— 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 18 දිනැති අංක 1915/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.11.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.09.23 දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූර් ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 28 (අ) වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 16 (ඇ) වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 973 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.09.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---